ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2020.02.21**

**පෝතක බාලදක්ෂ ආචාර්ය - ලී පදක්කම් පුහුණුව**

**චක්‍රලේඛ අංක : 08/03/2020**

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

85 වන IV අදියර පෝතක බාලදක්ෂ ආචාර්ය උසස් පාඨමාලාව
2020 අප්‍රේල් මස 25 වන සෙනසුරාදා සිට 29 වන බදාදා දක්වා
මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී

**පෝතක බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථක ව නිම කළ, **පෝතක බාලදක්ෂ** ආචාර්යවරුන් හා වරියන් සඳහා **පෝතක බාලදක්ෂ** අංශයේ IV අදියර උසස් පාඨමාලාව **2020** අප්‍රේල් මස **25** වන සෙනසුරාදා සිට **29** වන බදාදා දක්වා මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

ඔබ දිස්ත්‍රික්කයේ **පෝතක බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථකව නිමා කර ඇති **පෝතක බාලදක්ෂ** අංශයේ **පෝතක බාලදක්ෂ** ආචාර්යවරුන් හා වරියන් මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබනු ඇත.

- **පාඨමාලාව පැවැත්වෙන දිනයන්** - **2020** අප්‍රේල් මස **25** වන සෙනසුරාදා දින සිට **29** වන බදාදා දක්වා
  - **භාෂා මාධ්‍යය** - සිංහල හා දෙමළ
- **IV අදියර පෝතක බාලදක්ෂ ආචාර්ය උසස් පාඨමාලාවට සහභාගීවීමට තිබිය යුතු සුදුසුකම්**
  1. III අදියර සාර්ථකව නිමා කර තිබීම.
  2. **2020** වසර සඳහා අධිකාරී පත්‍රයක් ලබා තිබීම හෝ නවීකරණයට මූලස්ථානයට යොමු කර තිබීම.
  3. මීට පෙර වෙනත් අංශයකින් IV අදියර පාඨමාලාවක් හදාරා ඇත්නම්, එම අංශයෙන් ලී පදක්කම දිනා, එම අංශයට වසර **03**ක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.
- **සම්මුඛ පරීක්ෂණය** - ඉහත පාඨමාලාව සඳහා **2020** මාර්තු **14** සෙනසුරාදා දින **පෙ.ව. 10.00** ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට සම්පූර්ණ නිල ඇඳුමින් පැමිණිය යුතු ය.
- **2020 මාර්තු 14 වන සෙනසුරාදා දින සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතු දේ**
  1. අධිකාරී පත්‍රයේ පිටපතක්
  2. අදාල කොටස සම්පූර්ණ කළ "බාලදක්ෂ ආචාර්ය පුහුණු ප්‍රගති වාර්තාව - I අදියර සිට V අදියර දක්වා" පොත
  3. පාඨමාලා ගාස්තුව ගෙවීම සඳහා මුදලින් රු. **3000/-** ක් (රු. **3000/-** මුදලින් රු. **500/-** ක මුදලක් දිස්ත්‍රික්කයෙන් වැය දරන්නේ නම්, මැනවි.)
  4. **2** අදියර සහතිකය (**2** අදියරින් පසු මාස **06**ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.)
  5. නියමිත පැවරුම් **11** සම්පූර්ණ කර, දිස්ත්‍රික් පුහුණු සම්බන්ධීකාරක හෝ ස.දි.කො. (පුහුණු) වරයාගේ නිර්දේශය I අදියර සිට V අදියර දක්වා" පොතෙහි අදාළ පිටුවෙහි සටහන් කර රැගෙන ආ යුතු ය.
  6. දින **05** ක් ප්‍රායෝගිකව නේවාසික පුහුණුව ලැබීමට සුදුසු සෞඛ්‍ය තත්වයේ සිටින බවට වෛද්‍ය සහතිකයක්


ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: srilankascouts@ymail.com
Web : Srilankascouts.lk

➢ **<u>සැලකිය යුතු කරුණු</u>**

1. **අධිකාරී පත්‍රයක් නොමැති කිසිවකු පාඨමාලාවට ඇතුලත් නොකෙරේ.**
2. **සම්මුඛ පරීක්ෂණයට නිවැරදිව සම්පූර්ණ නිල ඇඳුමෙන් පෙනී සිටිය යුතු ය.**
3. **පාඨමාලාවට ඇතුලත් කිරීමෙන් පසු දැනුම් දීමක් කර, සහභාගි නොවුවහොත් පමණක් ගෙවූ මුදලින් 75% ක් ආපසු ගෙවනු ලැබේ.**

පාඨමාලා ගාස්තුව රු. **3000/-** කි. එම ගාස්තුව, ජාතික බාලදක්ෂ මූලස්ථානයේ, මහජන බැංකු මූලස්ථාන ශාඛාවේ ගිණුම් අංක **204 1001500 85323** දරණ ගිණුමට බැර කර, එම තැන්පතු පත්‍රිකාව, සම්පූර්ණ කරණ ලද අයදුම් පත්‍රය සමග යොමු කිරීමට කටයුතු කරන්න. සංවිධාන කටයුතු කිරීමේ පහසුව උදෙසා නියමිත කාලය තුළ දී අයදුම් පත්‍ර යොමු කරවීමට කටයුතු කරණ ලෙස කාරුණික ව දැනුම් දෙමි.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබ දිස්ත්‍රික්කයේ සිටින **පෝතක බාලදක්ෂ** අංශයේ **පෝතක බාලදක්ෂ** ආචාර්යවරුන් හා වරියන් IV අදියර පාඨමාලාව හැදෑරීම සඳහා මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය සම්පූර්ණ කර, **<u>2020 මාර්තු 07 දින හෝ එදිනට ප්‍රථම</u>** ජාතික බාලදක්ෂ මූලස්ථානයට යොමු කරවීමට කටයුතු කරන්න.

ස්තූතියි.

මෙයට,

බාලදක්ෂ සේවයේ නියුතු,

*අ/කළේ*
**එස් ඒ අමරසිංහ**
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

*අ/කළේ*
**ප්‍රියදර්ශනි ජයකොඩි**
පාඨමාලා අධ්‍යක්ෂිකා

<u>පිටපත -</u>

1. ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් තුමා - කා.දැ.පි.
2. නියෝජ්‍ය ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් තුමා - කා.දැ.පි.
3. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් - කා.දැ.පි.
4. සභාපති/විධායක සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය - කා.දැ.පි.